# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2208/49 - 2021 ජනවාරි මස 01 වැනි සිකුරාදා - 2021.01.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (X) (අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී.වී. 9729 දරන, අංක 92, සුනේත්‍රාදේවී මාවත, කොහුවල 10250, නුගේගොඩ හි පිහිටි සමාගමක් වන රෝයල් ඉන්ස්ටිටියුට් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, උසස් අධ්‍යාපනය වර්ධනය කිරීමේ කාර්යය සඳහා, මෙහි II වන උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි දක්වා ඇති කෙටි යෙදුම දරන්නා වූ, මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය ප්‍රදානය කරන්නා වූ, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස රෝයල් ඉන්ස්ටිටියුට් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නිශ්චිත කොන්දේසිවලට යටත්ව, මෙයින් පිළිගනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. රෝයල් ඉන්ස්ටිටියුට් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් අන්තර්ජාතික ආර්ථික විද්‍යාව හා මූල්‍ය පිළිබඳ ව්‍යාපාරවේදී (ගෞරව) උපාධිය සම්බන්ධයෙන් වන අධ්‍යයන පාඨමාලාව අංක 92, සුනේත්‍රාදේවී මාවත, කොහුවල 10250, නුගේගොඩ යන ලිපිනයැති ස්ථානයෙහි පමණක් පවත්වනු ලැබිය යුතු ය.

2. සිසුවකු ඇතුළත් කර ගැනීම සඳහා වන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම -

(අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී වාණිජ විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇඳුනු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම.

විය යුතුය.

3. මේ නියමය පළ කරනු ලබන දින සිට සෑම අවුරුදු පහකට (5) වරක්, II වන උපලේඛනයේ නිශ්චිතව දක්වෙන උපාධිය ප්‍රදානය කිරීම සඳහා, නිශ්චිත බලධරයා විසින් විෂය ප්‍රතිසමාලෝචනයක් පවත්වනු ලැබිය යුතු ය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා කෙටි යෙදුම්* |
|---|---|
| අන්තර්ජාතික ආර්ථික විද්‍යාව හා මූල්‍ය පිළිබඳ ව්‍යාපාරවේදී (ගෞරව) උපාධිය | බීබී ගෞරව (අන්තර්ජාතික ආර්ථික විද්‍යාව හා මූල්‍ය) |

**මහාචාර්ය ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

01 - 186

---

එල්.ඩී.බී. 21/1978 (X) (අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පීවී. 2268 දරන, අංක 591, ගාලු පාර, කොළඹ 6 හි පිහිටි සමාගමක් වන බිස්නස් මැනේජ්මන්ට් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, උසස් අධ්‍යාපනය වර්ධනය කිරීමේ කාර්යය සඳහා, මෙහි II වන උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි දක්වා ඇති කෙටි යෙදුම දරන්නා වූ, මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය ප්‍රදානය කරන්නා වූ, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස බිස්නස් මැනේජ්මන්ට් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නිශ්චිත කොන්දේසිවලට යටත්ව, මෙයින් පිළිගනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. බිස්නස් මැනේජ්මන්ට් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය සම්බන්ධයෙන් වන අධ්‍යයන පාඨමාලාව අංක 591, ගාලු පාර, කොළඹ 6 යන ලිපිනයැති ස්ථානයෙහි පමණක් පවත්වනු ලැබිය යුතු ය.

2. සිසුවකු ඇතුළත් කර ගැනීම සඳහා වන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම -

(අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී වාණිජ්‍ය විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇඳුනු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම.

විය යුතුය.

3. මේ නියමය පළ කරනු ලබන දින සිට සෑම අවුරුදු පහකට (5) වරක්, II වන උපලේඛනයේ නිශ්චිතව දක්වෙන උපාධිය ප්‍රදානය කිරීම සඳහා, නිශ්චිත බලධරයා විසින් විෂය ප්‍රතිසමාලෝචනයක් පවත්වනු ලැබිය යුතු ය.

**II වන උපලේඛනය**

| I වන තීරය<br>උපාධිය | II වන තීරය<br>උපාධිය සඳහා කෙටි යෙදුම් |
|---|---|
| ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) | බීබීඑම් (ගෞරව) |

**මහාචාර්ය ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

01 - 187

---

එල්.ඩී.බී. 21/1978 (X) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී.වී. 62877 දරන උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සමාගමක් වන හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද (2020 පෙබරවාරි මස 27 වැනි දින අංක 2164/54 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) 2018 ජනවාරි මස 11 වැනි දින අංක 2053/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනෙහි කෙටි යෙදුමට ඉක්බිතිවම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. සිසුවකු ඇතුළත් කර ගැනීම සඳහා අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව විෂයය ධාරාව යටතේ හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය ධාරාව යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම විය යුතුය.

2. මෙම නියමය පළ කරනු ලබන දින සිට සෑම අවුරුදු පහකට (5) වරක්. II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධිය ප්‍රදානය කිරීම සඳහා, නිශ්චිත බලධරයා විසින් විෂය ප්‍රතිසමාලෝචනයක් පවත්වනු ලැබිය යුතු ය.

II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා කෙටි යෙදුම* |
|---|---|
| ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (ජෛව තාක්ෂණ) |

**මහාචාර්ය ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

01 - 188

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.